# උත්තර භාරතීය හින්දු සංස්කෘතියෙහි හා ලාංකේය උඩරට සංස්කෘතියෙහි කෙරෙන විවාහ චාරිත්‍ර විධි පිළිබඳ සංසන්දනාත්මක විමසුමක්

*කරුණාරත්න, කේ. ජේ. එන්. ඒ.* [1]

ස්ත්‍රියක හා පුරුෂයෙකු අතර පැවත්වෙන ආචාරශීලී හවුල් ජීවිතය විවාහය යනුවෙන් හැඳින්විය හැකිය. සෑම සමාජයකම පැවැත්ම උදෙසා විවාහය අවශ්‍ය වන්නක් වන අතර එය එකී සමාජයට සුවිශේෂී ස්වභාවයෙන් සිදු කරයි. ආගමික කර්තව්‍යයන් සඳහා පුත්‍රයෙකුගේ අවශ්‍යතාව, පරම්පරාව පවත්වාගෙන යාම හා රතිසැප විඳීම විවාහයේ පරමාර්ථ බව වේද සාහිත්‍යයෙහිද දැක්වේ. විවාහය නැමැති ස්ත්‍රී පුරුෂ සම්බන්ධයට ඈත අතීතයේ සිටම සිරිත්-විරිත් පැවති බව පෙනේ. මෙම සිරිත්-විරිත් රැසක් යම් යම් වෙනස්කම් සහිතව වර්තමානයෙහිද අප සමාජයෙහි දක්නට ලැබේ. භාරතීය සංස්කෘතියෙහි **'සෝලහ් සංස්කාර්'** නම් චාරිත්‍ර දහසයෙන් විවාහ චාරිත්‍රයට සුවිශේෂී වැදගත්කමක් හිමි වන්නේ විවාහය යනු ස්ත්‍රියකගේ හා පුරුෂයෙකුගේ ශරීරය පමණක් නොව ආත්මයන්ද සම්බන්ධ වීමක් බව ඔවුන් පිළිගන්නා බැවිනි. එසේම බ්‍රාහ්මණ ආශ්‍රම ධර්මයන්හිද **'ගෘහස්ථ ආශ්‍රමයට'** ප්‍රවේශ වන්නේ විවාහයෙනි. විවාහයට ප්‍රථමයෙන් ගැළපෙන ජීවන සහකරුවෙකු හෝ සහකාරියක තෝරා ගැනීම සඳහා භාරතයේ පමණක් නොව ලංකාවෙහිද වැදගත් ස්ථානයක් හිමි වේ. මෙහිදී ජාතිය, කුලය, ආගම මෙන්ම ජන්ම පත්‍ර ගැළපීමටද අවධානයක් යොමු කරයි. හින්දු විවාහය පවිත්‍ර ආගමික චාරිත්‍රයකි. එම විවාහ චාරිත්‍ර සඳහා හින්දු පූජකයන් සහභාගි වුවද උඩරට විවාහ චාරිත්‍ර සඳහා භික්ෂූන් සම්බන්ධ නොවේ. නමුත් පෝරුවේ චාරිත්‍ර, අෂ්ඨක කීම, පැන් වැඩීම වැනි චාරිත්‍ර තුළ ආගමික ස්වරූපය දැකිය හැකිය. එසේම දැනට ලංකාවෙහි ක්‍රියාත්මක වන යම් යම් විවාහ චාරිත්‍ර පැරණි උත්තර භාරතීය විවාහ චාරිත අතරින් ශේෂ වූ ඒවා බව පෙනේ. මේ අනුව උත්තර භාරතීය හා ලාංකේය උඩරට සංස්කෘතියෙහි විවාහ චාරිත්‍රයන්හි සමානතා මෙන්ම අසමානතා පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පද:** උත්තර භාරතීය හින්දු සංස්කෘතිය, චාරිත්‍ර, ලාංකේය උඩරට සංස්කෘතිය, විවාහය, සිරිත්-විරිත්

*[1]ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*nipuniapekshika1994@gmail.com*